# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2271/23 - 2022 මාර්තු මස 15 වැනි අඟහරුවාදා - 2022.03.15

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.බී. 9/2016 (II)

**2015 අංක 5 දරන ජාතික ඖෂධ නියාමන අධිකාරිය පනත**

2015 අංක 5 දරන ජාතික ඖෂධ නියාමන අධිකාරිය පනතේ 142 වන වගන්තිය යටතේ සෞඛ්‍ය අමාත්‍යවරයා විසින් සාදනු ලබන නියෝග.

ආචාර්ය කෙහෙළිය රඹුක්වැල්ල,
සෞඛ්‍ය අමාත්‍ය.

2022 මාර්තු මස 15 වැනි දින,
කොළඹ දී ය.

නියෝග

2021 අගෝස්තු මස 19 වැනි දින අංක 2241/43 දරන *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද නියෝග මගින් සංශෝධිත 2019 මැයි මස 15 වැනි දින අංක 2123/35 දරන *අති විශේෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද 2019 ඖෂධ (මිල ඉහළ සීමා)නියෝග පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) එහි 1 වන නියෝගය ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන නියෝගය ආදේශ කිරීමෙන්:-

"1. මෙම නියෝග 2019 ඖෂධ (මිල ඉහළ සීමා) නියෝග යනුවෙන් හඳුන්වනු ලැබේ.";

(2) එහි 2 වන නියෝගය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන නියෝගය ආදේශ කිරීමෙන්:-

"2. මෙහි උපලේඛනයේ II වන තීරුවේ නිශ්චිතව දක්වා ඇති ඖෂධීය නාමය සහිත එහි III වන තීරුවේ අනුරූපි සටහනේ නිශ්චිතව දක්වා ඇති මාත්‍රා ආකාරයෙන් හෝ ලබා ගනු ලබන ක්‍රමයෙන් යුත් මෙහි IV වන තීරුවේ අනුරූපි සටහනේ නිශ්චිතව දක්වා ඇති ප්‍රබලතාවයෙන් යුත් ඖෂධවල (මෙහි මින්මතු "උපලේඛනගත ඖෂධ"යනුවෙන් සඳහන් කරනු ලබන)උපරිම සිල්ලර මිල මෙහි උපලේඛනයේ V වන තීරුවේ අනුරූපි සටහනේ නිශ්චිතව දක්වා ඇති පරිදි විය යුතු ය.";

(3) එහි 3 වන නියෝගය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන නියෝගය ආදේශ කිරීමෙන්:-

"3. උපලේඛනගත ඖෂධ පිළිබඳ වන උපරිම සිල්ලර මිල, එම උපලේඛනගත ඖෂධවල ඖෂධීය නාමයේ සියලු වෙළඳ නාමයන් සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.";

(4) එහි 4 වන නියෝගය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන නියෝගය ආදේශ කිරීමෙන්:-

"4. විකිණීමේ කාර්යය සඳහා උපලේඛනගත ඖෂධ සන්තකයේ තබාගෙන සිටින යම් නිෂ්පාදකයකු, ආනයනකරුවකු, වෙළෙන්දකු, බෙදාහරින්නකු, ඖෂධවේදියකු, වෛද්‍ය වෘත්තිකයකු, දන්ත වෛද්‍යවරයකු, පශු වෛද්‍යවරයකු, පෞද්ගලික වෛද්‍ය ආයතනයක් ඇතුළු වෛද්‍ය ආයතනයක්, ඔසුසලක් හෝ තැනැත්තකු විසින් ඒ උපලේඛනගත ඖෂධ උපලේඛනයේ V වන තීරුවේ නිශ්චිතව දක්වා ඇති උපරිම සිල්ලර මිලට හෝ 6 වන නියෝගයේ විධිවිධානවලට අනුකූලව නිශ්චය කරනු ලැබිය හැකි ප්‍රතිශෝධිත සිල්ලර මිලට හෝ වඩා වැඩි මිලකට විකුණනු නොලැබිය යුතු ය.";

(5) එහි 6 වන නියෝගය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන නියෝගය ආදේශ කිරීමෙන්:-

"6. (1) මේ නියෝග පළ කරනු ලබන දිනයේ දී, 2019 මැයි මස 15 වැනි දින අංක 2123/35 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද 2019 ඖෂධ (මිල ඉහළ සීමා) නියෝගවල උපලේඛනයේ V වන තීරුවේ නිශ්චිතව දක්වා ඇති උපරිම සිල්ලර මිලට වඩා අඩු මිලක් වන යම් ප්‍රතිශෝධිත සිල්ලර මිලකට 2021 අගෝස්තු මස 19 වැනි දින අංක 2241/43 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියෝග මගින් සංශෝධිත 2019 මැයි මස 15 දින අංක 2123/35 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද 2019 ඖෂධ (මිළ ඉහළ සීමා) නියෝග යටතේ පැරසිටමෝල් නොවන යම් උපලේඛනගත ඖෂධයක් විකුණනු ලබන යම් නිෂ්පාදකයකු හෝ ආනයනකරුවකු විසින් එම ප්‍රතිශෝධිත සිල්ලර මිල සමානුපාතිකව සම්පූර්ණ වශයෙන් සියයට තිස් අටක ප්‍රතිශතයකින් (38%) වැඩි කරනු ලැබිය හැකි ය. එම සියයට තිස් අටක (38%) සම්පූර්ණ වැඩිවීම සඳහා 2021 අගෝස්තු මස 19 වැනි දින අංක 2241/43 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියෝග මගින් වැඩි කරන ලද සියයට නවයක ප්‍රතිශතය (9%) සහ මෙම නියෝග මගින් වැඩි කරන ලද අනෙක් සියයට විසි නවයක ප්‍රතිශතය (29%) ඇතුළත් විය යුතු ය:

(2) (අ) මේ නියෝග පළ කරනු ලබන දිනයේ දී, 2022 පෙබරවාරි මස 28 වැනි දින අංක 2269/11 දරන *අතිවිශේෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද 2022 ඖෂධ (මි.ග්‍රෑ 500 පැරසිටමෝල් පෙති/කරල්වල මිල නියම කිරීමේ) නියෝග යටතේ මෙහි උපලේඛනයේ V වන තීරුවේ නිශ්චිතව දක්වා ඇති උපරිම සිල්ලර මිලට වඩා අඩු යම් ප්‍රතිශෝධිත සිල්ලර මිලකට පැරසිටමෝල් විකුණනු ලබන යම් නිෂ්පාදකයකු හෝ ආනයනකරුවකු විසින් එම ප්‍රතිශෝධිත සිල්ලර මිල සමානුපාතිකව සම්පූර්ණ වශයෙන් සියයට විසි නවයක ප්‍රතිශතයකින් (29%)වැඩි කරනු ලැබිය හැකි ය.

(ආ) සැක දුරු කිරීමේ කාර්යය සඳහා, 2022 පෙබරවාරි මස 28 වැනි දින අංක 2269/11 දරන *අතිවිශේෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද 2022 ඖෂධ (මි.ග්‍රෑ. 500 පැරසිටමෝල් පෙති/කරල්වල මිල නියම කිරීමේ) නියෝග මගින් වැඩි කරන ලද සම්පූර්ණ වැඩි වීම වන සියයට තිස් පහක ප්‍රතිශතය (35%) සඳහා 2021 අගෝස්තු මස 19 වැනි දින අංක 2241/43 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියෝග මගින් පැරසිටමෝල් සඳහා වැඩි කරන ලද සියයට නවයක (9%) ප්‍රතිශතය ඇතුළත් විය යුතු බවට මෙයින් ප්‍රකාශ කරනු ලැබේ.

(3) (1) වන සහ (2) වන අනු නියෝගවල විධිවිධානවල කුමක් සඳහන් වුව ද, උපලේඛනගත ඖෂධවල ප්‍රතිශෝධිත සිල්ලර මිලෙහි එවැනි වැඩි කිරීමක් මෙහි උපලේඛනයේ V වන තීරුවේ නිශ්චිතව දක්වා ඇති උපරිම සිල්ලර මිල නොඉක්මවිය යුතු ය.

(4) විකිණීමේ කාර්යය සඳහා උපලේඛනගත ඖෂධ සන්තකයේ තබාගෙන සිටින සෑම වෙළෙන්දකු, බෙදාහරින්නකු, ඖෂධවේදියකු, වෛද්‍ය වෘත්තිකයකු, දන්ත වෛද්‍යවරයකු, පශු වෛද්‍යවරයකු, පෞද්ගලික වෛද්‍ය ආයතනයක් ඇතුළු වෛද්‍ය ආයතනයක්, ඔසුසලක් හෝ තැනැත්තකු විසින් උපලේඛනගත ඖෂධවල මිල, උපරිම සිල්ලර මිල හෝ ප්‍රතිශෝධිත සිල්ලර මිල යන දෙකෙන් වඩාත් අඩු මිලෙහි පවත්වාගෙන යා යුතු ය."

(6) එහි 7 වන නියෝගය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන නියෝගය ආදේශ කිරීමෙන්:-

"7. උපලේඛනගත ඖෂධවල යම් මාත්‍රා ආකාරයක් හෝ ප්‍රබලතාවයක් සහ උපලේඛනගත ඖෂධවල එම මාත්‍රා ආකාරයේ හෝ ප්‍රබලතාවයේ උපරිම සිල්ලර මිල මෙහි උපලේඛනයේ V වන තීරුවේ නිශ්චිතව දක්වා නොමැති අවස්ථාවක දී, ජාතික ඖෂධ නියාමන අධිකාරිය විසින් ඒ මාත්‍රා ආකාරයේ හෝ ප්‍රබලතාවයේ උපලේඛනගත ඖෂධ සඳහා වන මිල නියම කරනු ලැබිය යුතු ය.";

(7) එහි 8 වන නියෝගය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන නියෝගය ආදේශ කිරීමෙන්:-

"8. යම් නිෂ්පාදකයකු හෝ ආනයනකරුවකු විසින් මෙහි උපලේඛනයේ V වන තීරුවේ නිශ්චිතව දක්වා ඇති උපරිම සිල්ලර මිල හෝ ප්‍රතිශෝධිත සිල්ලර මිල යන දෙකෙන් වඩාත් අඩු මිල නිෂ්පාදිත හෝ වෙළඳපොලේ පවතින තොගයේ උපලේඛනගත ඖෂධවල වෙළඳ ඇසුරුම හෝ ලේබලය මත ප්‍රායෝගිකව හැකිතාක් ඉක්මනින් මුද්‍රණය හෝ සලකුණු කරනු ලැබිය යුතු යඃ

එසේ වුවද, මේ නියෝග පළකරනු ලබන දින සිට දින හතළිස් පහක කාලසීමාවක් ඉකුත්වීමට පෙර උපරිම සිල්ලර මිල හෝ ප්‍රතිශෝධිත සිල්ලර මිල යන දෙකෙන් වඩාත් අඩුමිල උපලේඛනගත ඖෂධවල වෙළඳ ඇසුරුම හෝ ලේබලය මත මුද්‍රණය හෝ සලකුණු කරනු ලැබිය යුතු ය.";

(8) එහි 9 වන නියෝගය ඉවත් කිරීමෙන්;

(9) එහි 10 වන නියෝගය ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන නියෝගය ආදේශ කිරීමෙන්:-

"10. මේ නියෝගවල විධිවිධාන උල්ලංඝනය කරනු ලබන යම් තැනැත්තකු විසින් වරදක් සිදුකරනු ලබන අතර 2015 අංක 5 දරන ජාතික ඖෂධ නියාමන අධිකාරිය පනතේ 131 වන වගන්තිය යටතේ ඔහුට එරෙහිව නඩු පවරනු ලැබිය යුතු ය.";

(10) එහි 11 වන නියෝගය ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන නියෝගය ආදේශ කිරීමෙන්:-

"11. උපලේඛනගත ඖෂධවල උපරිම සිල්ලර මිල හෝ ප්‍රතිශෝධිත සිල්ලර මිල යන දෙකෙන් වඩාත් අඩු මිල සෑම සිල්ලර අලෙවි සලකම ප්‍රදර්ශනය කිරීම, විකිණීමේ කාර්යය සඳහා උපලේඛනගත ඖෂධ සන්තකයේ තබාගෙන සිටින සෑම නිෂ්පාදකයකු, ආනයනකරුවකු, වෙළෙන්දකු, බෙදාහරින්නකු, ඖෂධවේදියකු, වෛද්‍ය වෘත්තිකයකු, දන්ත වෛද්‍යවරයකු, පශු වෛද්‍යවරයකු, පෞද්ගලික වෛද්‍ය ආයතනයක් ඇතුළු වෛද්‍ය ආයතනයක, ඔසුසලක හෝ තැනැත්තකුගේම වගකීම විය යුතු ය.";

(11) "වෛද්‍ය වෘත්තිකයා" යන යෙදුමේ අර්ථ නිරූපණයට ඉක්බිතිවම පහත දැක්වෙන අර්ථ නිරූපණය ඇතුළත් කිරීමෙන්:-

"තැනැත්තා" යන්නට, සංස්ථාගත කළ හෝ නොකළ පුද්ගල මණ්ඩලයක් ඇතුළත් වේ;"; සහ

(12) එහි උපලේඛනය ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන උපලේඛනය ආදේශ කිරීමෙන්:-

"**උපලේඛනය**

(2 වන නියෝගය)

*ඖෂධවල උපරිම සිල්ලර මිල*

| *I වන තීරුව* | *II වන තීරුව ඖෂධීය නාමය* | *III වන තීරුව ලබා ගනු ලබන ක්‍රමය/මාත්‍රා ආකාරය* | *IV වන තීරුව ප්‍රබලතාවය* | *V වන තීරුව උපරිම සිල්ලර මිල/ ශ්‍රී ලංකා රුපියල්* |
|---|---|---|---|---|
| 1 | ඇල්බෙන්ඩසෝල් | පෙති/කරල් | 400 මි.ග්‍රෑ | 50.67 |
| | | | | |
| 2 | ඇමොක්සිලීන් - ක්ලැවුලිනික් ඇසිඩ් | මුඛ මාර්ගයෙන් දියර වශයෙන් ලබා ගැනීම | 156 මි.ග්‍රෑ/5 මි.ලි | 485.59 |

| *I වන තීරුව* | *II වන තීරුව ඖෂධීය නාමය* | *III වන තීරුව ලබා ගනු ලබන ක්‍රමය/මාත්‍රා ආකාරය* | *IV වන තීරුව ප්‍රබලතාවය* | *V වන තීරුව උපරිම සිල්ලර මිල/ ශ්‍රී ලංකා රුපියල්* |
|---|---|---|---|---|
| | ඇමොක්සිලීන් - ක්ලැවුලිනික් ඇසිඩ් | පෙති/කරල් | 375 මි.ග්‍රෑ | 59.79 |
| | ඇමොක්සිලීන් - ක්ලැවුලිනික් ඇසිඩ් | පෙති/කරල් | 625 මි.ග්‍රෑ | 101.33 |
| | ඇමොක්සිලීන් - ක්ලැවුලිනික් ඇසිඩ් | එන්නත් | 1.2 ග්‍රෑ | 1065.76 |
| | | | | |
| 3 | ක්ලැරිත්‍රෝමයිසීන් | පෙති/කරල් | 250 මි.ග්‍රෑ | 61.65 |
| | ක්ලැරිත්‍රෝමයිසීන් | පෙති/කරල් | 500 මි.ග්‍රෑ | 124.99 |
| | ක්ලැරිත්‍රෝමයිසීන් | මුඛ මාර්ගයෙන් දියර වශයෙන් ලබා ගැනීම | 125 මි.ග්‍රෑ/5 මි.ලි. | 736.40 |
| | | | | |
| 4 | ඇසිත්‍රෝමයිසීන් | පෙති/කරල් | 250 මි.ග්‍රෑ | 63.51 |
| | ඇසිත්‍රෝමයිසීන් | පෙති/කරල් | 500 මි.ග්‍රෑ | 89.10 |
| | ඇසිත්‍රෝමයිසීන් | මුඛ මාර්ගයෙන් දියර වශයෙන් ලබා ගැනීම | 200 මි.ග්‍රෑ/5 මි.ලි. | 295.56 |
| | | | | |
| 5 | සෙෆියුරොක්සිම් | පෙති/කරල් | 250 මි.ග්‍රෑ | 76.85 |
| | සෙෆියුරොක්සිම් | පෙති/කරල් | 500 මි.ග්‍රෑ | 122.61 |
| | | | | |
| 6 | ඩොක්සිසයික්ලීන් | පෙති/කරල් | 100 මි.ග්‍රෑ | 17.07 |
| | | | | |
| 7 | ඇසික්ලොවීර් | පෙති/කරල් | 200 මි.ග්‍රෑ | 62.47 |
| | | | | |
| 8 | සිප්රොෆ්ලොක්සසීන් | පෙති/කරල් | 250 මි.ග්‍රෑ | 9.71 |
| | සිප්රොෆ්ලොක්සසීන් | පෙති/කරල් | 500 මි.ග්‍රෑ | 14.36 |
| | | | | |
| 9 | ලෙවෝෆ්ලොක්සසීන් | පෙති/කරල් | 250 මි.ග්‍රෑ | 40.87 |
| | ලෙවෝෆ්ලොක්සසීන් | පෙති/කරල් | 500 මි.ග්‍රෑ | 67.56 |
| | | | | |
| 10 | සෙපලෙක්සින් | පෙති/කරල් | 250 මි.ග්‍රෑ | 13.84 |
| | සෙපලෙක්සින් | පෙති/කරල් | 500 මි.ග්‍රෑ | 25.35 |
| | සෙපලෙක්සින් | මුඛ මාර්ගයෙන් දියර වශයෙන් ලබා ගැනීම | 125 මි.ග්‍රෑ/5 මි.ලි. | 447.58 |
| | | | | |
| 11 | සෙෆික්සිම් | පෙති/කරල් | 100 මි.ග්‍රෑ | 38.84 |
| | සෙෆික්සිම් | පෙති/කරල් | 200 මි.ග්‍රෑ | 72.12 |
| | සෙෆික්සිම් | මුඛ මාර්ගයෙන් දියර වශයෙන් ලබා ගැනීම | 100 මි.ග්‍රෑ/5 මි.ලි. | 582.69 |
| | | | | |

| *I වන තීරුව* | *II වන තීරුව ඖෂධීය නාමය* | *III වන තීරුව ලබා ගනු ලබන ක්‍රමය/මාත්‍රා ආකාරය* | *IV වන තීරුව ප්‍රබලතාවය* | *V වන තීරුව උපරිම සිල්ලර මිල/ ශ්‍රී ලංකා රුපියල්* |
|---|---|---|---|---|
| 12 | ඇම්ලොඩිපින් | පෙති/කරල් | 5 මි.ග්‍රෑ | 25.84 |
| | ඇම්ලොඩිපින් | පෙති/කරල් | 10 මි.ග්‍රෑ | 35.98 |
| | | | | |
| 13 | ඩිල්ටියසම් | පෙති/කරල් | 30 මි.ග්‍රෑ | 4.57 |
| | ඩිල්ටියසම් | පෙති/කරල් | 60 මි.ග්‍රෑ | 15.04 |
| | ඩිල්ටියසම් | පෙති/කරල් | 90 මි.ග්‍රෑ | 36.15 |
| | | | | |
| 14 | ලොසාටන් පොටැසියම් | පෙති/කරල් | 25 මි.ග්‍රෑ | 12.41 |
| | ලොසාටන් පොටැසියම් | පෙති/කරල් | 50 මි.ග්‍රෑ | 17.40 |
| | | | | |
| 15 | ලොසාටන්-හයිඩ්‍රොක්ලෝරෝතයෝසයිඩ් | පෙති/කරල් | 62.5 මි.ග්‍රෑ | 32.84 |
| | | | | |
| 16 | එනලප්‍රිල් | පෙති/කරල් | 5 මි.ග්‍රෑ | 10.13 |
| | එනලප්‍රිල් | පෙති/කරල් | 10 මි.ග්‍රෑ | 17.07 |
| | | | | |
| 17 | ඇටනොලෝල් | පෙති/කරල් | 25 මි.ග්‍රෑ | 5.06 |
| | ඇටනොලෝල් | පෙති/කරල් | 50 මි.ග්‍රෑ | 7.43 |
| | ඇටනොලෝල් | පෙති/කරල් | 100 මි.ග්‍රෑ | 21.96 |
| | | | | |
| 18 | නිෆඩිපින්-දීර්ඝ ක්‍රියාකාරිත්වයක් සහිත | පෙති/කරල් | 20 මි.ග්‍රෑ | 6.26 |
| | | | | |
| 19 | ක්ලෝපිඩොග්‍රෙල් | පෙති/කරල් | 75 මි.ග්‍රෑ | 29.57 |
| | | | | |
| 20 | ඇටෝවාස්ටැටින් | පෙති/කරල් | 5 මි.ග්‍රෑම් | 10.85 |
| | ඇටෝවාස්ටැටින් | පෙති/කරල් | 10 මි.ග්‍රෑ | 18.83 |
| | ඇටෝවාස්ටැටින් | පෙති/කරල් | 20 මි.ග්‍රෑ | 29.72 |
| | ඇටෝවාස්ටැටින් | පෙති/කරල් | 40 මි.ග්‍රෑම් | 41.81 |
| | | | | |
| 21 | රොසුවාස්ටැටින් | පෙති/කරල් | 5 මි.ග්‍රෑ | 36.31 |
| | රොසුවාස්ටැටින් | පෙති/කරල් | 10 මි.ග්‍රෑ | 62.47 |
| | | | | |
| 22 | ටෙල්මිසාටන් | පෙති/කරල් | 20 මි.ග්‍රෑ | 17.22 |
| | ටෙල්මිසාටන් | පෙති/කරල් | 40 මි.ග්‍රෑ | 27.36 |
| | ටෙල්මිසාටන් | පෙති/කරල් | 80 මි.ග්‍රෑ | 51.34 |
| | | | | |

| *I වන තීරුව* | *II වන තීරුව ඖෂධීය නාමය* | *III වන තීරුව ලබා ගනු ලබන ක්‍රමය/මාත්‍රා ආකාරය* | *IV වන තීරුව ප්‍රබලතාවය* | *V වන තීරුව උපරිම සිල්ලර මිල/ ශ්‍රී ලංකා රුපියල්* |
|---|---|---|---|---|
| 23 | ඇස්පිරින් | පෙති/කරල් | 75 මි.ග්‍රෑ. | 5.06 |
| | ඇස්පිරින් | පෙති/කරල් | 100 මි.ග්‍රෑ. | 8.95 |
| | | | | |
| 24 | මෙට්පෝමින් | පෙති/කරල් | 500 මි.ග්‍රෑ. | 6.67 |
| | මෙට්පෝමින් - දීර්ඝ ක්‍රියාකාරිත්වයක් සහිත | පෙති/කරල් | 500 මි.ග්‍රෑ. | 13.00 |
| | මෙට්පෝමින් | පෙති/කරල් | 850 මි.ග්‍රෑ. | 12.50 |
| | | | | |
| 25 | ග්ලිබෙන්ක්ලමයිඩ් | පෙති/කරල් | 5 මි.ග්‍රෑ. | 3.70 |
| | | | | |
| 26 | ග්ලික්ලසයිඩ් | පෙති/කරල් | 80 මි.ග්‍රෑ. | 19.09 |
| | | | | |
| 27 | තයිරොක්සින් | පෙති/කරල් | 50 මයික්‍රෝ ග්‍රෑ. | 10.29 |
| | තයිරොක්සින් | පෙති/කරල් | 100 මයික්‍රෝ ග්‍රෑ. | 15.38 |
| | | | | |
| 28 | ග්ලිපිසයිඩ් | පෙති/කරල් | 5 මි.ග්‍රෑ. | 13.35 |
| | | | | |
| 29 | ඉබියුප්‍රොෆෙන් | පෙති/කරල් | 200 මි.ග්‍රෑ. | 1.86 |
| | ඉබියුප්‍රොෆෙන් | පෙති/කරල් | 400 මි.ග්‍රෑ. | 6.26 |
| | | | | |
| 30 | ඩයික්ලොෆෙනැක් සෝඩියම් | පෙති/කරල් | 50 මි.ග්‍රෑ. | 21.96 |
| | ඩයික්ලොෆෙනැක් සෝඩියම් | පෙති/කරල් | 100 මි.ග්‍රෑ. | 25.50 |
| | | | | |
| 31 | ඩයික්ලොෆෙනැක් පොටෑසියම් | පෙති/කරල් | 50 මි.ග්‍රෑ. | 18.50 |
| | | | | |
| 32 | පැරසිටමෝල් | පෙති/කරල් | 500 මි.ග්‍රෑ. | 2.97 |
| | | | | |
| 33 | සෝඩියම් වැල්ප්‍රොඒට් | පෙති/කරල් | 200 මි.ග්‍රෑ. | 15.20 |
| | | | | |
| 34 | රිස්පෙරිඩොන් | පෙති/කරල් | 1 මි.ග්‍රෑ. | 13.35 |
| | රිස්පෙරිඩොන් | පෙති/කරල් | 2 මි.ග්‍රෑ. | 15.61 |
| | | | | |
| 35 | ඔලන්සපින් | පෙති/කරල් | 5 මි.ග්‍රෑ. | 16.89 |
| | ඔලන්සපින් | පෙති/කරල් | 10 මි.ග්‍රෑ. | 35.11 |
| | | | | |
| 36 | කාබමසපින් | පෙති/කරල් | 200 මි.ග්‍රෑ. | 20.25 |
| | | | | |

| I වන තීරුව | II වන තීරුව ඖෂධීය නාමය | III වන තීරුව ලබා ගනු ලබන ක්‍රමය/මාත්‍රා ආකාරය | IV වන තීරුව ප්‍රබලතාවය | V වන තීරුව උපරිම සිල්ලර මිල/ ශ්‍රී ලංකා රුපියල් |
|---|---|---|---|---|
| 37 | ඇල්ප්‍රසෝලැම් | පෙති/කරල් | 0.25 මි.ග්‍රෑ. | 10.98 |
| | ඇල්ප්‍රසෝලැම් | පෙති/කරල් | 0.5 මි.ග්‍රෑ. | 16.73 |
| | | | | |
| 38 | ෆ්ලුඔක්සටින් | පෙති/කරල් | 20 මි.ග්‍රෑ. | 18.58 |
| | | | | |
| 39 | ගැබාපෙන්ටින් | පෙති/කරල් | 100 මි.ග්‍රෑ. | 28.29 |
| | ගැබාපෙන්ටින් | පෙති/කරල් | 300 මි.ග්‍රෑ. | 55.99 |
| | | | | |
| 40 | බෙක්ලොමෙතසෝන් | ඩී. පී කරල් (ආශ්වාස කිරීම) | 200 මයික්‍රෝ ග්‍රෑ. | 10.13 |
| | බෙක්ලොමෙතසෝන් | ඩී. පී කරල් (ආශ්වාස කිරීම) | 400 මයික්‍රෝ ග්‍රෑ. | 11.48 |
| | බෙක්ලොමෙතසෝන් | මීටර් මාත්‍රා ආශ්වාස උපකරණය (මාත්‍රා 200) | 100 මයික්‍රෝ ග්‍රෑ. | 857.17 |
| | බෙක්ලොමෙතසෝන් | මීටර් මාත්‍රා ආශ්වාස උපකරණය (මාත්‍රා 200) | 250 මයික්‍රෝ ග්‍රෑ. | 947.52 |
| | | | | |
| 41 | සැල්බියුටමෝල් | ඩී. පී කරල් (ආශ්වාස කිරීම) | 200 මයික්‍රෝ ග්‍රෑ. | 6.75 |
| | සැල්බියුටමෝල් | ඩී. පී කරල් (ආශ්වාස කිරීම) | 400 මයික්‍රෝ ග්‍රෑ. | 9.29 |
| | සැල්බියුටමෝල් | මීටර් මාත්‍රා ආශ්වාස උපකරණය (මාත්‍රා 200) | 100 මයික්‍රෝ ග්‍රෑ. | 523.59 |
| | | | | |
| 42 | මීතයිල්ප්‍රෙඩ්නිසෝලෝන් | පෙති/කරල් | 4 මි.ග්‍රෑ. | 20.01 |
| | මීතයිල්ප්‍රෙඩ්නිසෝලෝන් | පෙති/කරල් | 16 මි.ග්‍රෑ. | 69.25 |
| | | | | |
| 43 | ඔමෙප්‍රසෝල් | පෙති/කරල් | 20 මි.ග්‍රෑ. | 7.60 |
| | | | | |
| 44 | පැන්ටොප්‍රසෝල් | පෙති/කරල් | 20 මි.ග්‍රෑ. | 28.70 |
| | පැන්ටොප්‍රසෝල් | පෙති/කරල් | 40 මි.ග්‍රෑ. | 47.28 |
| | | | | |
| 45 | ඉසොමෙප්‍රසෝල් | පෙති/කරල් | 20 මි.ග්‍රෑ. | 34.11 |
| | ඉසොමෙප්‍රසෝල් | පෙති/කරල් | 40 මි.ග්‍රෑ. | 64.86 |
| | | | | |
| 46 | ඩොම්පෙරිඩෝන් | පෙති/කරල් | 10 මි.ග්‍රෑ. | 9.12 |
| | | | | |
| 47 | රැබිප්‍රසෝල් | පෙති/කරල් | 10 මි.ග්‍රෑ. | 19.09 |
| | රැබිප්‍රසෝල් | පෙති/කරල් | 20 මි.ග්‍රෑ. | 36.40 |
| | | | | |
| 48 | ඇලෙන්ඩ්‍රොනික් ඇසිඩ් | පෙති/කරල් | 70 මි.ග්‍රෑ. | 171.26 |
| | | | | |

| *I වන තීරුව* | *II වන තීරුව ඖෂධීය නාමය* | *III වන තීරුව ලබා ගනු ලබන ක්‍රමය/මාත්‍රා ආකාරය* | *IV වන තීරුව ප්‍රබලතාවය* | *V වන තීරුව උපරිම සිල්ලර මිල/ ශ්‍රී ලංකා රුපියල්* |
|---|---|---|---|---|
| 49 | සෙෆ්ටසිඩීම් | නික්ෂේපන | 500 මි.ග්‍රෑම් | 772.12 |
| | සෙෆ්ටසිඩීම් | නික්ෂේපන | 1 ග්‍රෑම් | 1286.87 |
| | | | | |
| 50 | සෙෆ්ට්‍රිඇක්සෝන් | නික්ෂේපන | 250 මි.ග්‍රෑම් | 386.06 |
| | සෙෆ්ට්‍රිඇක්සෝන් | නික්ෂේපන | 500 මි.ග්‍රෑම් | 723.86 |
| | සෙෆ්ට්‍රිඇක්සෝන් | නික්ෂේපන | 1 ග්‍රෑම් | 1126.00 |
| | | | | |
| 51 | සෙෆොටැක්සීම් | නික්ෂේපන | 500 මි. ග්‍රෑම් | 361.94 |
| | සෙෆොටැක්සීම් | නික්ෂේපන | 1 ග්‍රෑම් | 603.22 |
| | | | | |
| 52 | ෆ්ලුකොනසෝල් | පෙති/කරල් | 50 මි.ග්‍රෑම් | 40.21 |
| | ෆ්ලුකොනසෝල් | පෙති/කරල් | 150 මි.ග්‍රෑම් | 72.38 |
| | | | | |
| 53 | ඉන්සියුලින් සොලියුබල් හියුමන් | නික්ෂේපන | 100 අයි.යු/1මි.ලී. (10 මි.ලී.කුප්පිය) | 1930.29 |
| | ඉන්සියුලින් සොලියුබල් හියුමන් | නික්ෂේපන | 100 අයි.යු/1 මි.ලී. (3 මි.ලී. කාට්‍රිජය) | 965.15 |
| | ඉන්සියුලින් අයිසොෆෙන් හියුමන් | නික්ෂේපන | 100 අයි.යු/1 මි.ලී. (10 මි.ලී. කුප්පිය) | 1930.29 |
| | ඉන්සියුලින් අයිසොෆෙන් හියුමන් | නික්ෂේපන | 100 අයි.යු/1 මි.ලී (3 මි.ලී. කාට්‍රිජය) | 965.15 |
| | බයිෆෙසික් අයිසෝෆෙන් ඉන්සියුලින් (ඉන්සියුලින් සොලියුබල් හියුමන් 30 අයි. යු/1 මි. ලි, ඉන්සියුලින් අයිසෝෆෙන් හියුමන් 70 අයි.යු./1 මි.ලි.) මිශ්‍රණයක් ලෙස | නික්ෂේපන | 100 අයි.යු/1 මි.ලී. (10 මි.ලී. කුප්පිය) | 1930.29 |
| | බයිෆෙසික් අයිසෝෆෙන් ඉන්සියුලින් (ඉන්සියුලින් සොලියුබල් හියුමන් 30 අයි. යු/1 මි. ලි, ඉන්සියුලින් අයිසෝෆෙන් හියුමන් 70 අයි.යු./1 මි.ලි.) මිශ්‍රණයක් ලෙස | නික්ෂේපන | 100 අයි.යු/1 මි.ලී (3 මි.ලී. කාට්‍රිජය) | 965.15 |
| | | | | |
| 54 | ග්ලිම්පිරයිඩ් | පෙති | 1 මි.ග්‍රෑම් | 11.51 |
| | ග්ලිම්පිරයිඩ් | පෙති | 2 මි.ග්‍රෑම් | 16.32 |
| | ග්ලිම්පිරයිඩ් | පෙති | 3 මි.ග්‍රෑම් | 27.35 |
| | ග්ලිම්පිරයිඩ් | පෙති | 4 මි.ග්‍රෑම් | 29.75 |
| | | | | |
| 55 | සිටාග්ලිප්ටින් | පෙති | 25 මි.ග්‍රෑම් | 24.12 |
| | සිටාග්ලිප්ටින් | පෙති | 50 මි.ග්‍රෑම් | 45.83 |
| | සිටාග්ලිප්ටින් | පෙති | 100 මි.ග්‍රෑම් | 78.01 |
| | | | | |

| *I වන තීරුව* | *II වන තීරුව ඖෂධීය නාමය* | *III වන තීරුව ලබා ගනු ලබන ක්‍රමය/මාත්‍රා ආකාරය* | *IV වන තීරුව ප්‍රබලතාවය* | *V වන තීරුව උපරිම සිල්ලර මිල/ ශ්‍රී ලංකා රුපියල්* |
|---|---|---|---|---|
| 56 | ටැම්සුලොසීන් | පෙති/කරල් | 0.40 මි.ග්‍රෑම් | 33.77 |
| | | | | |
| 57 | මොන්ටිලුකාස්ට් | පෙති | 4 මි.ග්‍රෑම් | 19.31 |
| | මොන්ටිලුකාස්ට් | පෙති | 5 මි.ග්‍රෑම් | 24.12 |
| | මොන්ටිලුකාස්ට් | පෙති | 10 මි.ග්‍රෑම් | 33.77 |
| | | | | |
| 58 | ප්‍රෙගබලීන් | පෙති/කරල් | 50 මි.ග්‍රෑම් | 19.70 |
| | ප්‍රෙගබලීන් | පෙති/කරල් | 75 මි.ග්‍රෑම් | 24.94 |
| | ප්‍රෙගබලීන් | පෙති/කරල් | 100 මි.ග්‍රෑම් | 30.96 |
| | ප්‍රෙගබලීන් | පෙති/කරල් | 150 මි.ග්‍රෑම් | 38.61 |
| | ප්‍රෙගබලීන් | පෙති/කරල් | 300 මි.ග්‍රෑම් | 63.55 |
| | | | | |
| 59 | ටොපිරමේට් | පෙති/කරල් | 25 මි.ග්‍රෑම් | 32.17 |
| | ටොපිරමේට් | පෙති/කරල් | 50 මි.ග්‍රෑම් | 51.47 |
| | ටොපිරමේට් | පෙති/කරල් | 100 මි.ග්‍රෑම් | 83.64 |
| | | | | |
| 60 | ලැමෝට්‍රිජීන් | පෙති | 25 මි.ග්‍රෑම් | 19.31 |
| | ලැමෝට්‍රිජීන් | පෙති | 50 මි.ග්‍රෑම් | 33.77 |
| | ලැමෝට්‍රිජීන් | පෙති | 100 මි.ග්‍රෑම් | 56.30 |

(13) 2022 පෙබරවාරි මස 28 වැනි දින අංක 2269/11 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද 2022 ඖෂධ (මි.ග්‍රෑ. 500 පැරසිටමෝල් පෙති/කරල්වල මිල නියම කිරීමේ) නියෝග මෙයින් පරිච්ඡින්න කරනු ලැබේ.

EOG 03 - 0897

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.